prයිම් ග්‍රාමීන්

# මෙහෙවර

අඳුර දුරලන සොඳුරු මෙහෙවර

3 කාණ්ඩය – අටවන කලාපය – 2015 අප්‍රේල්



නිරූපනය : ඩබ්ලිව්. ප්‍රේමවතී මහත්මිය

ප්‍රයිම් ග්‍රාමීන් අම්බලන්ගොඩ ශාඛාවේ සාමාජිකා

ඡායාරූප : ලක්ෂමන් කුමාරතුංග

HNB "Prime Grameen is a subsidiary of Hatton National Bank PLC"

ජීවිතයට අරුතක්



# ජීවිතයේ සාර්ථකත්වයට

## වගකීම් කළමනාකරණය කරගන්නේ කෙසේද..?

කාලය කළමනාකරණය කළ නොහැකිය. කෙනෙකු තමාව කළමනාකරණය කරගන්නා විට කාලය ඉබේම කළමනාකරණය වෙයි. සෑම කෙනෙකුම දැක්මක් සහ මෙහෙවරක් සහිතව අනාගතයට ඉලක්ක තබා වැඩ කරනවා නම් අඩු කාලයක් තුළ වැඩි වැඩ ප්‍රමාණයක් කර ගැනීමටත් සෑම අවුරුද්දකම... දශකයකම... සහ ජීවිත කාලය තුළදීම.... වැඩි ඵලදායීතාවයක් ලැබීමට හැකිවනු ඇත.දින, සති, මාස, අවුරුදු, දශක ලෙස ජීවිතයේ ඉදිරිය කොටස් වලට වෙන් කර ගනිමින් ඉලක්ක තැබීමට පුරුදු වන අය වැඩි ඉලක්ක ප්‍රමාණයක් සපුරා ගන්නා බව පර්යේෂණාත්මකව හෙළි වී ඇත. මෙහිදී IQ සහ EQ යන පෞරුෂත්ව වර්ගීකරණයන් ගැන අපගේ අවධානය යොමු කිරීම වටී.

IQ පෞරුෂත්වය සෑම දෙයක්ම තාර්කිකව විද්‍යාත්මකව කිරීමට උත්සාහ ගනී. EQ පෞරුෂත්වය සෑම දෙයක්ම හැඟීම් මුල්කරගෙන එම මොහොතට අදාල වන අන්දමට සිදු කිරීමට උත්සුක වන ස්වාභාවයක් පළ කරයි. IQ අය ඉලක්ක තබා වැඩ කිරීමට රුචි වන අතර EQ අය හිතට දැනෙන විදිහට නිදහසේ වැඩ කිරීමට කැමැත්තක් දක්වති. මේ දෙවර්ගයේම හොඳ සහ නරක ඇත. එම නිසා අවශ්‍ය වන්නේ මේ දෙවර්ගයේම මැද තත්වය අවබෝධ කරගෙන වැඩ කිරීමයි. සෑම දෙයක්ම තාර්කිකව ඉලක්ක තබා ඉෂ්ට කර නොගත හැකි බව සත්‍යයකි. එමෙන්ම සෑම දෙයක්ම හැඟීම් බරව හැඟීම් මුල්කරගෙන කිරීමට යාමෙන්ද ගැටළු මතුවන බව අවබෝධ කරගත යුතුය. එම නිසා මේ දෙක අතර තත්වයක් එනම් යම් ප්‍රමාණයක් හැඟීම් වලට මුල්තැනක් දෙමින්ද එමෙන්ම අනාගතය එක්තරා ප්‍රමාණයකට සැලසුම් කරගනිමින්ද මධ්‍යස්ථව ජීවිත ගමන ගෙන යාමට උත්සාහ දැරිය යුතුය.

සිංහල හින්දු අළුත් අවුරුද්ද වැනි අවස්ථාවක් කැලැන්ඩරයට එකතු වී ඇත්තේ මිනිසුන්ට මෙම තාර්කික බුද්ධිය සහ හැඟීම් බුද්ධිය අතර සමබර බවක් ඇතිකර ගැනීමට බව අපට පැහැදිලි කළ හැකිය.ඔබ අළුත් අවුරුද්දක උණුසුමේ කල් යවන මෙවන් කාල වකවානුවකදී අද සිට මාස දොළහක් ඉදිරියට ඇති තම ඉලක්ක ගැනද,.. ඒවා ඉටුකරගැනිම සඳහා ඔබ විසින් කළයුතු ප්‍රධානම කාර්යයන් ගැනද ලිඛිතව සටහන්කොට ඊට අනුව කටයුතු කරන්න සිතට ගන්න. එය හරියාකාරව සිදු කිරීමට ඔබ කටයුතු කළොත් විශාල ජයග්‍රහන රැසක් ඉදිරි වසරේදී අත්පත් කර ගැනීමට ඔබට හැකිවනු නොඅනුමානය.



නීතීඥ, වෛද්‍ය
**කුමා ඉද්දමල්ලෙන**
පෞරුෂත්ව පුහුණු විශේෂඥ

සාමාන්‍ය මිනිසුන්ගේ ප්‍රධාන දුර්වලතාවයක් නම් "ඔහේ කරගෙන ගොස්" ගැටළු මතුකරගෙන පසුව ඒවාට විසඳුම් සෙවීමට විශාල වෙහෙසක් දැරීමයි. ගැටළුවක් විසදීමට උත්සාහ ගනිද්දී තව ගැටළු දහසක් මතුවන බව මනෝ විද්‍යාතමක විග්‍රාහයයි.එම නිසා ගැටළු මතු වීමට පෙර මතුවිය හැකි ගැටළු මෙනෙහි කර ඒවා අඩුකර ගැනීමට පියවර ගැනීම බුද්ධිමත් පුද්ගලයකුගේ ස්වාභාවයයි.

තමාට ලැබීඇති කාලය තුළ තමාට කළ හැකි කාර්යයන් ප්‍රමාණය අනුමාන කොට ඒ සඳහා ඉලක්ක තැබීම කාල කළමනාකරණයේ මූලික පියවර වෙයි.

සමහරෙක් ජීවිතයට සුවිශේෂී ඉලක්කයක් තබා ඒ වෙනුවෙන් ඉතා කැපවී වැඩකොට එය ඉටුකර ගනී. නමුත් එසේ ඉලක්කය ඉටු කර ගන්නා විට ජීවිතයේ තවත් අංශ ගණනාවක් අසාර්ථක වීමට ඉඩ ඇත.එයට හේතුව මේ ජීවන කරලිය තුළ එක් පුද්ගලයකුට චරිත කිහිපයක්ම රඟපෑමට සිදුවීමයි. එක් ඉලක්කයක් සාර්ථක කර ගැනීමට දැඩිසේ වෙහෙසෙන අයකුට අනෙකුත් චරිතයන්ට හිමි වගකීම් නිසි අයුරින් සමබර ලෙස ඉටුකිරීම අසීරු වෙයි. උදාහරණයක් ලෙස ගතහොත් විවාහක දරුවන් සිටින පුරුෂයකු පිළිබඳව සිතා බලමු. ඔහුට බිරිඳක් සිටින නිසා ස්වාමි පුරුෂයකුගේ චරිතයද, දරුවන් සිටින නිසා පියෙකුගේ චරිතයද, දෙමව්පියන් සිටින නිසා පුතෙකුගේ චරිතයද, යාළුවන් සිටින නිසා මිතුරකුගේ චරිතයද, අසල් වැසියන් සිටින නිසා අසල් වැසියකුගේ චරිතයද, ආයතනයක සේවය කරන නිළධාරියකු නම් එම නිළධාරියාට හිමි චරිතයද යනාදී වශයෙන් චරිත ගණනාවක වගකීම් ඉටු කිරීමට ඔහු බැඳී සිටියි. කෙනෙකු ආයතනයක නිළධාරියාට හිමි චරිතය වෙනුවෙන් 95% කාලය වැය කළහොත් එවිට ස්වාමි පුරුෂයා, පියා,පුතා, අසල්වැසියා, මිතුරා යන චරිත වලට හිමි වගකීම් දැරීමට ඉතිරිවන්නේ මුළු කාලයෙන් 5% පමණකි. එවිට නිවස තුළද , මිතුරන් අතරද අසල් වැසියන් අතරද ගැටළු කාරී ස්වාභාවයක් මතුවීම ස්වාභාවිකය.

මේ තත්වය අනෙක් පැත්තටද එසේමය. යමෙක් ගෙදරදොර කටයුතු වලට වැඩි කාලයක් වෙන්කරයි නම් ඒ සඳහාම කැපවී කටයුතු කරයි නම් ඔහුගේ වෘත්තීයමය චරිතය ඉතා පහත් මට්ටමකට වැටීම වැළැක්විය නොහැකිය.ඔහු රැකියාව කරන ආයතනයට ඔහුගෙන් ඉටුවිය යුතු සේවාව නිසි අයුරින් නොසැපයෙන නිසා ආයතනය තුළ ඔහු සාර්ථකත්වයට පත් නොවේ.

මේ තත්වය අද දවසේ හොඳින් තේරුම්ගෙන තමාට හිමි චරිත මොනවාද යන්න පිළිබඳව හොඳින් සිතා බලා ඒ ඒ චරිතයට තමා විසින් දෙනු ලබන අවධානය කෙතරම්දැයි නිසි තක්සේරුවකට එළැඹීමෙන් මේ සෑම චරිතයකටම හිමි වගකීම් සහ යුතුකම් නිසි අයුරින් ඉටු කිරීමට වගබලා ගැනීම නව යුගයේ ප්‍රධානතම කාල කළමනාකරණ ක්‍රම වේදය බවට නිර්දේශ කළ හැකිය.

සිංහල අළුත් අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර දෙස බලද්දී මා මුලින් සඳහන් කළ IQ සහ EQ (තාර්කික බුද්ධිය සහ හැඟීම් බුද්ධිය) යන පෞරුෂත්ව වර්ගයන්ට තමන්ට හිමි විවිධ චරිත වල සමබරව රඟපෑමට වක්‍රලෙස අවස්ථාව සලසා දීමක් ලෙස මට හැඟීයයි.එම නිසා මෙම නව වසරක් ලැබූ සුබ මොහොතේ පෑනත් කොළයත් අතට ගෙන තමාගේ ඉලක්ක පැහැදිලිව ලියා තබා තමාට හිමි එක් එක් චරිතයන්ට තමන් අතින් ඉටුවන යුතුකම් ප්‍රමාණවත්ද යන්න පිළිබඳව නිසි තක්සේරුවකට එළැඹෙමින් නිසි කළමනාකරණයකින් යුතු ජීවිතයක් ගත කිරීමට පියවර ගැනීමට ඔබට අධිෂ්ඨාන ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

**ඔබගේ දියුණුවට අවශ්‍ය ක්‍රමය හෝ මාර්ගය ඇත්තේ ඔබ අසලමය.**

# අපිට නැවත ජීවිතය...ලබා දුන්නාට ඔබතුමන්ලා හැමෝටම හුඟක් පිං...



ආදරණීය සර්....

හෙට දවසක් පිළිබඳව කිසිදු බලාපොරොත්තුවක් හෝ විශ්වාසයක් නැතිව

ජීවත්වෙන දහසක් දරුවන් අතරේ අපි තව දෙන්නෙක් විතරයි තමයි.

ජීවිතේ හෙට දවස පිළිබඳව අස්ථිර කමක් දැනෙද්දි

ඒ අසරණ කමට පිළිසරණක් සොයද්දි

ඔබ තුමන්ලා අපිට පිහිටට ඉන්න බව දැනගත්තාම

අපේ පුංචි හිත්වලට වගේම අපේ අම්මලගේ තාත්තලගේ හිත්වලටත්

දැණුනේ කියන්න බැරි තරමේ සතුටක්....

ඒ සතුට ...ඒ ජීවිතය...අපිට නැවත ලබා දුන්නාට ඔබතුමන්ලා හැමෝටම හුඟක් පිං...

සර්.....

දැන් අපිට හෙටක් පිළිබඳව ආයිත් හිතන්න පුළුවන් ....

ඒ ගැන බලාපොරොත්තුවක් දල්වාගන්න පුළුවන්....

ඒ ඔබතුමන්ලාගේ පිහිටෙන්....

ගොඩක් ස්තූතියි...

- චමෝදි , කවිෂ්ක-

චමෝදි හංසනී..කවිෂ්ක පියමාල්..... ජීවිතේ සුවඳ ඉව කරන පුංචි මල් කැකුළු දෙකක්. ඒත් ඒ සුවද හමන මල් කැකුළු දෙකම පසුගිය කාලය ගත කළේ තරමක අවිනිශ්චිතතාවයකින් .... ඒ ගැන කතාව තරමක අනුවේදනීය එකක් වුණත් ඒ කතා දෙකේම අවසානය සුන්දර එකක් වූනිසා ප්‍රයිම් ග්‍රාමීන් සහෝදරත්වයත් සමඟ ඒ සතුට බෙදාහදා ගන්නට අපි හිතුවා.

චන්ද්‍රා කුමාරි මහත්මිය ප්‍රයිම් ග්‍රාමීන් සමාගමේ නගර ශාඛාවේ සාමාජිකාවක්.ඇදුම් මැසීම සිය ස්වයං රැකියාව කරගත්තු චන්ද්‍රාගේ දරු පැටව් තුන්දෙනාගෙන් චමෝදි හංසනී ඉගෙනුම ලැබුවේ පිළියන්දල චන්ද්‍රරත්න මානවසිංහ විද්‍යාලයේ. 2014 අවුරුද්දේ පහ වසරේ ශිෂ්‍යත්වය ඉහළින්ම සමත් වුණු හංසනී පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලයට ඇතුළත්වෙන්න දින ගනිමින් උන්නා. වෙනදා නොතිබුණු අසනීප තත්වයක් ඇය කෙරෙන් චන්ද්‍රා කුමාරි මහත්මියට දැක ගන්නට ලැබෙන්නේ මේ අතරතුරේදියි.

"දරුවගේ හදවතේ සිදුරක් ...ඉක්මණින් සැත්කමක් කරන්න වෙයි...." හංසනී පරීක්ෂා කළ රුවන් මොරවක්කෝරාල විශේෂඥ වෛද්‍යවරයාගේ ප්‍රකාශයත් එක්ක චන්ද්‍රා කුමාරිට දැණුනේ මුළු ලෝකයම තමන් පාමුල කඩන් වැටෙනවා වගෙයි.දැන් මං මොකද කරන්නේ ...ඒත් එක්කම ඇගේ හිතට නැගුනේ ඒ සඳහා වැය වෙන මුදල සොයාගැනීම පිළිබඳ ගැටළුවක්...

"රිජ්වේ ආර්යා ළමා රෝහලේ ඔපරේෂන් එක නොමිලේ කෙරුණත් හදවත් සැත්කම සඳහා අවශ්‍ය උපකරණයක් අපිට මිළදී ගන්න සිද්ධ වුණා. ඒකට රුපියල් ලක්ෂයක් වැයවෙනවා . මේ වෙලාවේ අපිට ඒක හුඟක් ලොකු මුදලක්. අපි දන්න කියන හිතවත් උදවියගෙන් උදව්වක් බලාපොරොත්තු වෙනවා මිසක අපිට කරන්න වෙන දෙයක් තිබුණෙ නෑ. මේ වගේ අපි අසරණ වුණු වෙලාවක තමයි

ප්‍රයිම් ග්‍රාමීන් සමාගමේ නගර ශාඛාවේ කළමනාකාරතුමා මාර්ගයෙන් "ප්‍රයිම් ග්‍රාමීන් මෙහෙවර සත්කාර අරමුදල" ගැන අපිට දැනගන්නට ලැබුණෙ...."

ප්‍රයිම් ග්‍රාමීන් පුත්තලම ශාඛාවේ සාමාජිකා ජසින්තා ප්‍රනාන්දු මහත්මියත් චන්ද්‍රා වගේම අසරණ තත්වයට පත්වුණ් ඇගේ දස හැවිරිදි පුතු කවිෂ්ක පියුමාල් උපතේ සිටම ගොදුරු වී සිටි ශ්‍රවනාබාධිත තත්වයක් හේතුවෙන්

"පුතාට අවුරුදු එකහමාරෙදි තමයි මම දැනගත්තේ පුතාගේ කන් වල ආබාධයක් තියෙනවා කියලා. 2006 දි වෛද්‍ය නිර්දේශය මත පුතාට ශ්‍රවන උපකරණයක් සවි කළත් පුතා වැඩෙද්දි ඒ උපකරණය ප්‍රමාණවත් වුණේ නෑ. සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් ලැබුණු ආධාර මත අපි වෙනත් ශ්‍රවන උපකරණයක් සවි කළත් ඒක පාවිච්චි කරගෙන යද්දි පුතාගේ කන් පැසවන්න පටන් ගත්තා. තවත් බලා ඉන්න බැරි තැන මම ග්‍රාමීන් සමාගමේ සමන් හේමජිත් සර්ට මගේ දුක්ගැනවිල්ල කිව්වා.... එතැනදි තමයි මට "ප්‍රයිම් ග්‍රාමීන් මෙහෙවර අරමුදල" ගැන දැනගන්න ලැබුණෙ.."

ප්‍රයිම් ග්‍රාමීන් මෙහෙවර සත්කාර අරමුදල තම ශක්ති ප්‍රමාණයෙන් මේ අසරණ දරු දෙදෙනාට පිහිට වීමට දෙවරක් සිතුවේ නෑ. ඒ පිළිබඳව අපට කරුණු දැක්වූ මෙහෙවර සත්කාර අරමුදලේ සම්බන්ධීකාරක ජ්‍යේෂ්ඨ කළමනාකරු සුදේශ් පෙරේරා මහතා අප සමඟ ඒ ගැන කිව්වේ මෙහෙම කතාවක්...." හංසනී දියණියගෙ ශල්‍යකර්මය වෙනුවෙන් මෙහෙවර සත්කාර අරමුදලෙන් අපිට වෙන්කරන්න පුළුවන් වුණේ රු. 25000/මුදලක් විතරයි.කවිෂ්කගෙ ශ්‍රවන උපකරණය සඳහාත් ඒ සමානම මුදලක් අපි ලබා දෙන්න තීරණය කළා.ඒත් මේ දරුවො දෙන්නගේ වැඩේට ඒ මුදල ප්‍රමාණවත් නෑ. හිඟ මුදල ලබාදීම ඇත්තෙන්ම අපිට ගැටළුවක් වුණා. මේ පිළිබඳව අවසානයේ අපි අපේ කළමනාකරණ අධ්‍යක්ෂතුමන්ට..., චමින්ද ප්‍රභාත් මහතාණන්ට දැනුම් දුන්නා. ඒ වෙලාවේ එතුමන් තීරණය කළා මේ දරුවන් දෙදෙනාගේ අවශ්‍යතාවය සම්පූර්ණයෙන්ම අපේ වියදමින්ම ඉටුකරලා දෙන්න. ඒ අනුව ප්‍රභාත් සර්ගේ සහ ඔහුගෙ හිතවතුන් කිහිප දෙනෙකුගේ පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් ඉතිරි මුදල සම්පූර්ණ කරදීලා හංසනීටත් කවිෂ්කටත් පිහිට වෙන්න අපි කටයුතු කළා.

රු 96000/ වටිනා ශ්‍රවන උපකරණයකින් පැහැදිලි ශ්‍රවන තත්වයක් කවිෂ්කටත් , සාර්ථක සැත්කමකින් පසු සොඳුරු නිරෝගී ජීවිතයක් හංසනීටත් අද උරුමවෙලා. ඒ සතුට උතුරා හැලෙන දෑස් එක්ක පසුගියදාක ප්‍රයිම් ග්‍රාමීන් නිවහනට මේ පුංචි දුවයි පුතයි ගොඩවුණේ ඔවුන්ට ජීවිතය දුන්නු අපි හැමෝටම ස්තූතිකරලා යන්න. ජීවිත වලට සතුට කැන්දන් එන මේ භාග්‍යවන්ත මාසයේ අපි හැමෝම වගේ පුංචි හංසනියි කවිෂ්කයි දෙන්නත් ජයටම අවුරුදු කන්න ඇති. ඒ සතුට ඔවුන්ට උදාකරදුන් පින අපි හැමෝගෙම ජීවිතවලට අද වගේම හෙටත් සෙත් කවියක් වී ගැයෙනු ඇති.

**ඒ සතුට උතුරා හැලෙන දෑස් එක්ක පසුගියදාක ප්‍රයිම් ග්‍රාමීන් නිවහනට මේ පුංචි දුවයි පුතයි ගොඩවුණේ ඔවුන්ට ජීවිතය දුන්නු අපි හැමෝටම ස්තූතිකරලා යන්න. ජීවිත වලට සතුට කැන්දන් එන මේ භාග්‍යවන්ත මාසයේ අපි හැමෝම වගේ පුංචි හංසනියි කවිෂ්කයි දෙන්නත් ජයටම අවුරුදු කන්න ඇති. ඒ සතුට ඔවුන්ට උදාකරදුන් පින අපි හැමෝගෙම ජීවිතවලට අද වගේම හෙටත් සෙත් කවියක් වී ගැයෙනු ඇති.**





**සහජීවනයෙන් කටයුතු කිරීම තුළින් ඔබ නිරායාසයෙන්ම නායකයෙකු බවට පත්වේ.**

## ප්‍රයිම්ග්‍රාමීන් ශාඛාවක වගතුග

# ග්‍රාමීන් දැක්ම අම්බලන්ගොඩ ප්‍රදේශය තුළ සැබෑවක් කිරීම අපේ අරමුණයි...”

## -ප්‍රයිම් ග්‍රාමීන් අම්බලන්ගොඩ ශාඛාව

වෙරළත වැදී පෙණ පිඩු නංවන මහ සයුර නගන ඝෝෂාව පරයන කළඹලකාරී නගරය අවදි වී තවමත් හෝරා දෙක තුනකට වඩා ගෙවී ගොස් නැත. හිස ගිණි ගත්තවුන් සේ අරමුණු සොයා දිවයන මිනිස් පොදිය අතරින් අප රැගත් රිය අම්බලන්ගොඩ නගරයට සේන්දුවෙයි. දිරියෙන් ජීවිතය ජය ගත් ව්‍යාපාරිකයින් රැසක් ජනිත අම්බලන්ගොඩ පුරවරය දකුණු ලක කීර්තිමත් නගරයක් බවට පත්වන්නේ ඒනිසාම පමණක් නොවේ.වෙස් මුහුණු ...රෑකඩ...වැනි ඉපැරණි කලාංග රැසක නිජබිම බවට ගත්තාම සාම්ප්‍රදායික ව්‍යාපාර වලට තරමක් නැඹුරු වූ ප්‍රදේශයක් විදිහට හඳුන්වන්න පුළුවන්.විශේෂයෙන් කුරුදු ආශ්‍රිත ව්‍යාපාර, කොහු ආශ්‍රිත ව්‍යාපාර,ධීවර කර්මාන්තය වැනි පාරම්පරිකව පවත්වාගෙන එනු ලබන ව්‍යාපාර බහුල වශයෙන් මේ ප්‍රදේශයේ ප්‍රචලිතයි. අනිත් අතින් ගත්තාම වෙස්මුහුණු , රෑකඩ, ලී කැටයම්, වගේ මේ ප්‍රදේශයටම ආවේණික වුණු ව්‍යාපාර සඳහා විශේෂ ප්‍රසිද්ධියක් අම්බලන්ගොඩ ප්‍රදේශය උසුලනවා. එයිනුත් කුරුදු ව්‍යාපාරය කරන්දෙණිය,ඌරගහ, බටපොළ කියන ප්‍රදේශ වල වැඩිපුර දකින්න පුළුවන්.අම්බලන්ගොඩ, හික්කඩුව,බෙන්තර වඩාත්ම බහුලව දකින්න පුළුවන් ස්වයං රැකියාව තමයි ධීවර කර්මාන්තය.අපේ සාමාජිකාවන් මාපලගම දක්වාත්, කහව පැත්තෙන් බටපොළ දොරල දක්වාත් වූ ප්‍රදේශ ආවරණය කරමින් අපේ මධ්‍යස්ථාන 93 ක් ස්ථාපිත කර තියෙනවා. මේ මධ්‍යස්ථාන හරහා සුළු ව්‍යාපාර සඳහා අප සමාගමේ සාමාජිකත්වය ලබාගන්නා සාමාජිකාවන්හට ණය මුදල් ලබාදෙනවා.

අපේ සාමාජිකාවන් මේ විවිධ තරාතිරමේ ව්‍යාපාරවල නිරත වෙනවා. ඔවුන්ට එම ව්‍යාපාර පවත්වාගෙන යාමට වගේම අළුතින් ව්‍යාපාර ආරම්භ කිරීමටත් අවශ්‍ය ණය පහසුකම් හා උපදෙස් ලබාදීමට අප සැදී පැහැදී සිටිනවා . අද වන විට අපේ සාමාජිකාවන් 3458 කට ණය පහසුකම් ලබා දී තියෙනවා. ඔවුන්ගේ ව්‍යාපාර සදහා නිකුත් කර ඇති ණය මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 378 ක්.

ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆිනෑන්ස් ලිමිටඩ් මගින් හදුන්වාදී ඇති ඉතුරුම් ක්‍රම වූ “යාළු”ළමා ඉතුරුම් ගිණුම මියුලැසි කාන්තා ඉතුරුම් ගිණුම සහ ප්‍රයිම් ඉතුරුම් ගිණුම යන ගිණුම් ක්‍රම සියල්ලත් අපේ ශාඛාවෙහි ක්‍රියාත්මකයි. සාමාජිකාවන් ගේ එදිනෙදා අවශ්‍යතා සඳහා ක්ෂණිකව ලබාදෙන “සහන ණය ” ණය ක්‍රමය යටතේ අපේ සාමාජිකාවන්ගේ දූ දරුවන්ගෙ අධ්‍යාපනික අවශ්‍යතා එදිනෙදා වියදම් ආදියට යම් පිළිසරණක් වීමට අපි කටයුතු කරනවා. මේ යටතේ පසුගිය කාලය තුළ රුෑමිඃ 37 මුදලක් සහන ණය වශයෙන් අපි ලබාදුන්නා. සාමාජිකාවන්ගේ සහ ඔවුන්ගේ පවුලේ උදවිය වෙනුවෙන් සලසා ඇති සාමාජිකාව සහ ණය ආරක්ෂණ අරමුදල යටතේ මරණාධාර සහ වන්දි මුදල් වශයෙන් රුපියල් 37650000 මුදලක් ලබාදීමට පසුගිය කාලය තුළ අපි කටයුතු කළා.

අපේ සාමාජිකාවන් වෙත ව්‍යාපාරික ගනුදෙනුවකින් එහා ගිය සමාජ සත්කාර්යයක නියැලෙන්නට අපි නිරන්තරයෙන් උත්සාහ කරනවා. අව්වැසි බලන්නෙ නැතිව රෑ දහවල් පිළිබඳ නිනව්වක් නැතිව අපි වෙහෙසෙන්නෙ උදාර පරමාර්ථයක් වෙනුවෙන්ය කියන හැඟීම අප කා තුළත් තියෙනවා. එතැනදි තරගකාරී ආයතන තව බොහොමයක් තියෙනවා කියලා ණය මුදල් දෙන්නන් වාලේ දෙන්න අපි ලෑස්ති නෑ. මොකද අපේ ගනුදෙනුකරුවන් ණය උගුලක පටලවන්න අපිට බැහැ. ඔවුන්ගේ ව්‍යාපාරික අවශ්‍යතාවට ගැලපෙන ප්‍රමාණයට ක්‍රමානුකූලව ව්‍යාපාරය දියුණු කරන්න අවශ්‍ය ණය මුදල අපි ලබා දෙනවා .මේ නිසාම ප්‍රයිම් ග්‍රාමීන් ආයතනය සාමාජිකාවන් උදෙසා නායකත්ව සහ කළමනාකරණ පුහුණු වැඩසටහන් දෙකක් සංවිධානය කළා.ඉදිරියේදී ඔවුන්ගේ ආචාර ධර්ම පද්ධතිය දියුණු කිරීම සඳහා වැඩසටහනක් සංවිධානය කරන්න බලාපොරොත්තු වෙනවා.මොකද මේ සමාජ තරගකාරීත්වයත් එක්ක මිනිස්සුන්ගේ අවංකභාවය ගිලිහී යමින් තියෙනවා.මූල්‍ය විනය හා ව්‍යාපාරික අවංකභාවය මිනිස්සුන්ගේ දියුණුව සඳහා ඉතාමත් වැදගත් සාධක දෙකක් කියලා අපි විශ්වාස කරනවා. ලංකාවේ මිනිස්සුන්ගේ දුප්පත්කම තුරන් කිරීම සඳහා ප්‍රයිම් ග්‍රාමීන් සමාගම ගෙන යන වැඩපිළිවෙල අම්බලන්ගොඩ ප්‍රදේශය තුළ සැබෑවක් කිරීමයි අපේ එකම අරමුණ...”

**ප්‍රයිම් ග්‍රාමීන්**
**මයික්‍රෝ ෆිනෑන්ස් ලිමිටඩ්**
**අංක 63, ගාලු පාර**
**අම්බලන්ගොඩ**
**දුරඃ 0912258946**
**ඊ මේල්**
ambalangoda@primegrameen.lk






ප්‍රයිම් ග්‍රාමීන් සමාගමේ අම්බලන්ගොඩ ශාඛාවේ කාර්ය මණ්ඩලය

### ප්‍රයිම් ග්‍රාමීන් අම්බලන්ගොඩ ශාඛාවේ නිළධාරී මඬුල්ල

**ප්‍රාදේශිය කළමනාකරු**
වසන්ත සිරිවර්ධන
**ශාඛා කළමනාකරු**
මහේෂ් උදය
**සහකාර කළමනාකරු**
එම්.පී. එදිරිසිංහ
**මූල්‍ය අංශ ප්‍රධානි**
මිලාන් ශාමික
**ක්ෂේත්‍ර කළමනාකරු**
රසික දේශප්‍රිය
**ක්ෂේත්‍ර විධායක**
නාලක ප්‍රදීප්
ධනුක උමේෂ්
චන්න දයාප්‍රිය
සී.එම්. ආටිගල
එම්.ඒ.ඒ. ඉංදික
සහන් ගිම්හාන
නුවන් ජයසංඛ
සජිත් ජයමාන්න
තිළිණ සතරසිංහ
**ඉතුරුම් විධායක**
සමීර රුද්‍රිගු
**ගිණුම් සහායක**
තිලාන් සංජීව
චින්තක කුලසේකර
දශිකා නුවන්ති

**සටහන -**
**මංජුල ප්‍රභාත් හෙට්ටිආරච්චි**
**ඡායාරූප -**
**ලක්ෂමන් කුමාරතුංග**

පත්වීමේ ගෞරවයද ඒ සතුවේ. එවන් බිමකට දස වසකට පෙරාතුව සිට සේවය සදන ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆිනෑන්ස් සමාගමේ අම්බලන්ගොඩ ශාඛාවේ යුග මෙහෙවර පිළිබඳ වගතුග විමසීමට මෙවර අපගේ ශාඛාවක වගතුග තීරය වෙන්වෙයි.අම්බලන්ගොඩ ශාඛාවේ වග විත්ති විමසන අපගේ පිළිසඳර කතාබහට එහි ශාඛා කළමනාකරු මහේෂ් ශාන්ත සිල්වා මහතා සිය කටහඬ අවදිකළේ මේ අයුරිනි.

“ප්‍රයිම් ග්‍රාමීන් ශාඛා ලැයිස්තුවේ 25 වන තැන හිමි අම්බලන්ගොඩ ශාඛාව ප්‍රයිම් ග්‍රාමීන් ශාඛා ලැයිස්තුවට එක්වෙන්නේ 2004 සැප්තැම්බර් මසයේ ඉඳන්. එදා ඉඳන් අද වෙනතුරු ගෙවී ගිය කාල පරිච්ඡේදය තුළ මේ ප්‍රදේශයේ පවුල් 3460 ට වැඩි ප්‍රමාණයකට අපගේ සේවාව ලබාදීමට අපට හැකිවුණා. අම්බලන්ගොඩ කියන්නේ ලංකාවේ අනිත් ප්‍රදේශ එක්ක වැඩි පිරිසක් නියැලිලා ඉන්න තවත් ව්‍යාපාරයක් තමයි කොහු ආශ්‍රිත ව්‍යාපාර. මාදම්පේ, දේවගොඩ ප්‍රදේශ ඒ සඳහා වැඩි විශේෂත්වයක් උසුලනවා.

“ප්‍රයිම් ග්‍රාමීන් ශාඛාවක් අම්බලන්ගොඩ ස්ථාපිත වෙන්නේ 2004 අවුරුද්දේ. ඒ අංක 696 ගාලුපාර,රන්දොඹේ. දරණ තැන. 2012 දි අපි අංක 63,ගාලුපාර යන ලිපිනයේ නව ගොඩනැගිල්ලකට ගෙවැදුණේ අපේ ගනුදෙනු කරුවන්ට මෙන්ම මෙහෙයුම් කටයුතු වලටත් පහසුවක් වෙන්න . අම්බලන්ගොඩ නගරයේ ඉඳන් ගත්තාම විශාල ප්‍රදේශයක් පුරා පැතිරුණු සාමාජික සංඛ්‍යාවක් අද වන විට අපේ මූල්‍ය සේවාවන් ලබාගනිමින් සිටිනවා. විශේෂයෙන් අපේ මධ්‍යස්ථාන පිහිටුවලා තියෙන ප්‍රදේශ ගත්තොත් අම්බලන්ගොඩ ඉඳලා කොළඹ පාරෙ අලුත්ගම දක්වාත් ගාලු පැත්තට යද්දි හික්කඩුව දක්වාත්,ඇල්පිටිය පාරේ

පිළිබඳව පොදුවේ අපේ ගනුදෙනුකරුවන් තුළ තියෙන්නේ නොබිඳුණු අචල විශ්වාසයක්.ගනුදෙනුවලට එහා ගිය සමාජ සත්කාරක වැඩසටහන් සඳහාත් අපි ප්‍රමුඛතාවයක් ලබාදෙනවා.ඒ යටතේ පහුගිය කාලේ අපි අපේ

| මධ්‍යස්ථාන සංඛ්‍යාව | සාමාජික සංඛ්‍යාව | සේවක සංඛ්‍යාව | නිකුත් කළ ණය ප්‍රමාණය රු. |
|---|---|---|---|
| 93 | 3458 | 17 | රු. මි. 378 |



**වසන්ත සිරිවර්ධන**
ප්‍රාදේශීය කළමනාකරු



**මහේෂ් උදය**
ශාඛා කළමනාකරු



**එම්.පී. එදිරිසිංහ**
සහකාර කළමනාකරු



**මිලාන් ශාමික**
මූල්‍ය අංශ ප්‍රධානි



**රසික දේශප්‍රිය**
ක්ෂේත්‍ර කළමනාකරු

**නිතරම ඉදිරියට යා යුතු අතර පස්සට යන විදියත් දැන ගත යුතුය.**

# අපේ ව්‍යාපාරික අවශ්‍යතා ඉටුකර දීමට ප්‍රයිම් ග්‍රාමින් සමාගම දක්වන්නේ දැඩි සැලකිල්ලක්




අපි මිරිදිය ධීවර කර්මාන්තයේ යෙදෙන්නෙ පාරම්පරිකව. අවුරුදු 20 විතර වෙනවා මම මේ ව්‍යාපාරය පටන් අරන්. අපි වැඩිපුරම කරන්නේ මාදු ගඟ ආශ්‍රිතව ඉස්සො කොටු ගහන එක. ඊට අමතරව වීසි දැල්, එලන දැල් දාලත් මාළු අල්ලනවා. මේ කර්මාන්තෙ කරගෙන යද්දි හුඟක්ම සල්ලි ඕනවෙන්නේ ඉස්සො කොටු ගහන්න අවශ්‍ය බට , ලී. නයිලෝන් වගේ දේවල් ගන්නයි. අපි වගේ පුංචි ව්‍යාපාර කරන අයට ව්‍යාපාරයක් ඉදිරියට කරගෙන යන්න ණය මුදලක් දෙන ආයතන ඉතා අඩුව පැවති කාලයක ග්‍රාමින් සමාගම අපේ ඒ අවශ්‍යතාව ඉෂ්ට කරලා දෙන්න ඉදිරිපත් වුණේ අපේම වාසනාවට. සුළු ණය දෙන ආයතන දැන්නම් හුඟක් තියෙනවා. ඒත් ප්‍රයිම් ග්‍රාමින් සමාගමත් එක්ක තියෙන සම්බන්ධතාව අදටත් ඒ අයුරින්ම පවත්වාගෙන යන්නට අපි කටයුතු කරන්නේ ප්‍රයිම් ග්‍රාමින් සමාගමේ සර්ලගේ තියෙන සුහදශීලිත්වය සහ අපේ ව්‍යාපාරික අවශ්‍යතා තේරුම් ගැනීමට සහ ඒවා ඉටුකර දීමට ප්‍රයිම් ග්‍රාමින් සමාගම දක්වන සැලකිල්ල නිසයි.

**ඩබ්.ප්‍රේමවතී,**
**හීනටිය, බලපිටිය**

## වත්කම් ඉදිරිපත් කිරීමකින් තොරව ප්‍රයිම් ග්‍රාමින් සමාගමෙන් පහසුවෙන් ණය මුදලක් ගන්න පුළුවන්



මේ ප්‍රදේශයේ වැඩිපුරම දකින්න පුළුවන් ව්‍යාපාර අතර කුරුදු තැලීම පාරම්පරිකව පැවත එන ව්‍යාපාරයක් විදිහට හඳුන්වන්න පුළුවන්. මේ ව්‍යාපාරයේ නියැලෙන්න පුළුවන් අවුරුද්දෙ එක කාලයකට විතරයි. විශේෂයෙන් මාර්තු මාසෙ ඉඳලා ඉදිරි මාස කිහිපයක විතරයි. මගේ කුරුඳු ඉඩම් නෑ. එතැනදි අපි කරන්නේ කුරුඳු ඉඩම් තියෙන අයගේ අක්කරයක අක්කර භාගෙක වගේ ඉඩම් ප්‍රමාණයක තියෙන ගස් වලට ගාණක් කතා කරගෙන ඒ ගාණ ගෙවලා ගස් මිළදී අරගෙන කුරුදු තලවන එක.ඒකට සල්ලි ඕන. ඒ මුදල් අවශ්‍යතාව අපි පිරිමහා ගන්නෙ ප්‍රයිම් ග්‍රාමින් සමාගමෙන්. බැංකු වලින් අපි වගේ පුංචි ව්‍යාපාරිකයින්ට ණය මුදලක් ගනිද්දි ඇප වත්කම් පෙන්නන්න වෙනවා.. ඒත් කිසිදු ඇපයකින් හෝ වත්කම් ඉදිරිපත් කිරීමකින් තොරව ප්‍රයිම් ග්‍රාමින් සමාගමෙන් පහසුවෙන් ණය මුදලක් ගන්න පුළුවන්. මේ නිසා කරදරයකින් තොරව අපිට මේ ව්‍යාපාරයේ නියැලෙන්න පුළුවන්. අනිත් අතට සති වාරික ක්‍රමය නිසා අතට ලැබෙන විදිහට පහසුවෙන් ණය මුදල පියවන්නත් පුළුවන්.

**පී.ඩී. ශ්‍රියා මල්කාන්ති - කිරිපෙද්ද, අගනකැටිය.**

## ඇඟට දැනෙන්නේ නැතිව ඉක්මණින් ණය මුදල ගෙවා අවසන් කරන්න පුළුවන්



මම මුලින් ජොබ් එකක් කළා. ඉන් පස්සේ ඒකෙන් අයින්වෙලා ගෙදර ඉන්න අතරේ මට හිතුණා මොකක් හරි ස්වයං රැකියාවක් කරන්න තිබුණානම් හොඳයි නේද කියලා. ඒ සිතුවිල්ලෙ ඉන්න අතරේ තමයි මම පත්තරේක දැක්කේ ගන්නොරුව කෘෂි කර්ම පුහුණු ආයතනයෙන් බිම් මල් වගාව පිළිබඳව පුහුණු පාඨමාලා පැවත්වෙනවා කියලා. මම ඒ පාඨමාලාව හදාරලා ඔවුන්ගේ උපදෙස් මත හතු වගාව ආරම්භ කළා. ව්‍යාපාරය ආරම්භ කරන්න අවශ්‍ය මුදල් සොයා ගැනීම පිළිබඳව වූ ගැටළුවට මට විසඳුමක් වුණේ ග්‍රාමින් සමාගමේ ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්‍රමය. මම රු 5000/= ණය මුදලෙන් පටන් අරන් 10000/= 15000/= වගේ ණය මුදල් වලට ගියා.හතු පැකට් කළෙත් ඒවා ත්‍රීවිලර් එකක දාගෙන ගිහින් කඩවලට දැම්මේත් මමමයි. ග්‍රාමින් සමාගම ව්‍යාපාරය පවත්වාගෙන යන්න වගේම ඒක වැඩිදියුණු කරගන්නත් අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම කරනවා. අනික තමයි ණය ආපසු අය කර ගැනීමේ ක්‍රමවේදය. ඒ ක්‍රමය නිසා ඇඟට දැනෙන්නේ නැතිව පහසුවෙන් ණය මුදල ඉක්මණින් ගෙවා අවසන් කරන්න පුළුවන්.

**ස්වර්ණා හේමමාලි ලියනගේ - දොරණාගොඩ, බෙම්මුල්ල.**

## කලාව පවත්වාගෙන යන්නත් ප්‍රයිම් ග්‍රාමින් සමාගමෙන් උදව් ලැබෙනවා...



අම්බලන්ගොඩ කියූ සැනින් අපේ මතකයට එන්නේ රූකඩ. ඉපැරණි පාරම්පරික කලාංගයක් වූ රූකඩ කලාව වඳ වීගෙන යන කලාංගයක් වේදෝයි සැක සිතෙන තරමටම අද මේ කලාව රැකගෙන පවත්වාගෙන යන්නවුන් ඉන්නේ ඉතා අතළොස්සක් විතරයි. ඒ අය අතරින් ගන්වාරි නිමල් සහ කේ.ජී කාන්ති යුවලට හිමි වන්නේ ප්‍රමුඛ ස්ථානයක්. ප්‍රයිම් ග්‍රාමින් සමාගමේ අම්බලන්ගොඩ ශාඛාවේ සාමාජිකාවක් වන කේ.ජී. කාන්ති මහත්මිය ඔවුන් නියැලී සිටින ජීවන වෘත්තිය හෙවත් රූකඩ කලාව ඉදිරියට පවත්වාගෙන යාම සඳහා ප්‍රයිම් ග්‍රාමින් සමාගම ලබා දෙන්නාවූ සහයෝගය පිළිබඳව අප හමුවේ සිය අදහස් දැක්වූයේ මෙසේයි. " අපි නටවන රූකඩ බොහෝමයක් අපිම හදන ඒවා අපේ තාත්තලා සීයලා හදපු රූකඩත් මේවා අතර තියෙනවා. මේ කලාවේ නිරත වෙද්දි අපිට නිතර මුදල් අවශ්‍යතා ඇති වෙනවා.විශේෂයෙන් රූකඩ, වෙස්මුහුණු කපන්න, තිර රෙදි ගන්න සහ අලුත් වැඩියා කටයුතු වගේ දේවලට මම ප්‍රයිම් ග්‍රාමින් සාමාජිකත්වය ලබාගත්තේ මේ කලාව පවත්වාගෙන යන්න එදිනෙදාට අවශ්‍ය වෙන උපකරණ ගන්න. මේ වගේ කලාව හා සම්බන්ධ වුණු ව්‍යාපාරයක් කරද්දි බැංකුවකින් ණය මුදලක් ගන්න එක ඒ තරම් පහසු දෙයක් නෙවෙයි. ඒත් ප්‍රයිම් ග්‍රාමින් සමාගම ඒ අඩුපාඩුව සම්පූර්ණ කරන්න ඉදිරිපත් වීම අපි වගේ දුප්පත් කලාකාරයන්ගේ වාසනාවක්.

**කේ.ජී කාන්ති - බෝගහවත්ත, අම්බලන්ගොඩ.**

**අප හමුවේ ඇත්තේ අමාරුදෙය මිස කරන්න බැරි දෙය නොවේ.**

micro credit සංකල්පය පිළිබඳ සරල කියැවීමක්

# මයික්‍රෝ ක්‍රෙඩිට් ක්‍රමවේදයේ ආරම්භය හා විකාශනය. – 4 කොටස



ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆිනෑන්ස් සමාගමේ කළමණාකාර අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිළධාරි චමින්ද ප්‍රභාත් මහතා සමග කළ සාකච්ඡාවක් ඇසුරිනි.



## ග්‍රාමීය බැංකු සංකල්පයේ දුබලතා සහ ප්‍රබලතා

දෙමුහුන් සංකල්පයක් ලෙස බිහිවූ ග්‍රාමිය බැංකු සංකල්පය සහ එහි අන්තර්ගතය පිළිබඳව පසුගිය මෙහෙවර කලාපයෙන් අපි සාකච්ඡා කළෙමු. එහි වූ ප්‍රබලතා සේම එම ක්‍රමය තුළ වූ දුර්වලතා කිහිපයක්ද මෙහිදී අපට හඳුනාගන්නට ලැබේ. කණ්ඩායම් ණය ක්‍රමය පාදක කරගනිමින් බිහිවුණු ග්‍රාමීය බැංකු සංකල්පය තුළ අපට පහත සඳහන් දුර්වලතා හඳුනා ගන්නට ලැබේ.

ග්‍රාමීය බැංකු සංකල්පය තුළ වූ ගනුදෙනුකරුවන්ම එහි අයිතිකරුවන් බවට පත්වීමේ ක්‍රමවේදය නිසා මූල්‍ය පරිපාලනයේ යම් අක්‍රමිකතා ඇති වීම මේ ක්‍රමය තුළවූ ප්‍රධාන දුර්වලතාවයකි.

දෙනු ලබන ණය ප්‍රමාණය තීරණය කරනු ලබන්නේ කණ්ඩායම විසින්ම වීම තවත් දුර්වලතාවයකි.එහිදි අදාල ණය ලාභියාගේ අවශ්‍යතාව පිළිබඳව සැලකිලිමත් වන්නේ නැත. ණය ලබා දෙන්නා විසින් සොයා බලනු ලබන්නේ නැවත අය කර ගැනීම පිළීබඳව සහ ඇප සම්බන්ධයෙන් පමණකි. කණ්ඩායමේ ණය ලබන්නා පිළීබඳව සැලකිලිමත් නොවන අතර දෙනු ලබන ණය මුදල පිළිබඳව අදාල කණ්ඩායමම සාමූහිකව වගකීමට බැඳී සිටී.

ග්‍රාමීය බැංකු ක්‍රමවේදයේ සාර්ථකත්වයට බලපෑ ප්‍රධාන සාධකය වූයේ කණ්ඩායම තුළ වූ ශක්තිමත්භාවයයි. එහිදී ඔවුන් තුළ වූ එකමුතුභාවය එකිනෙකා කෙරෙහි වගකීමට බැඳී සිටීම වැනි කරුණු කණ්ඩායම් ක්‍රමය ශක්තිමත්ව පවත්වාගෙන යාමට හේතු වූ ප්‍රධාන කාරණා අතර විය. එහෙත් කණ්ඩායමක් තුළට ඊට නොගැලපෙන පිරිස් ඇතුළු වීම නිසා පසු කාලීනව කණ්ඩායම් ක්‍රමය අසාර්ථකත්වය කරා ගමන් කිරීමට හේතු විය. තනි තනි පුද්ගලයින්ට ඔවුන්ගේ ව්‍යාපාරය පිළිබඳව සැලකිලිමත් වෙමින් ණය ලබාදෙන ග්‍රාමීන් 02 සංකල්පය පසු කාලීනව බිහිවන්නේ එහි ප්‍රතිඵලයක් ලෙසය.

ග්‍රාමීය බැංකු සංකල්පය දුර්වලව යෑමට තුඩුදුන් තවත් හේතුවක් වන්නේ වගකීමෙන් තොරවූ මිනිසුන්ගේ ක්‍රියාකලාපයන් නිසා අපැහැදීමට පත් වූ වගකීමෙන් යුතුව කටයුතු කළ යහපත් සාමාජික පිරිස් මේ ක්‍රමවේදය අතැර කණ්ඩායමෙන් ඉවත්ව යාමට පියවර ගැනීමයි. අවසානයේ ග්‍රාමීය කණ්ඩායම් ක්‍රමවේදය තුළ ඉතිරි වූයේ නිවැරදිව තීරණ ගැනීමට හෝ ක්‍රමවේදය පිළිබඳව වගකීමෙන් යුතුව කටයුතු නොකළ පිරිස් පමණකි.

ග්‍රාමීය බැංකු ක්‍රමවේදය තුළ මෙන්ම සමූපාකාර ක්‍රමවේදය තුළද හදුනාගත හැකි එක් පොදු ලක්ෂණයක් වනුයේ කණ්ඩායම් ණය ක්‍රමයයි. ඒ තුළ පොදුවේ දැකිය හැකි සාධනීය ගුණාංග ගණනාවක් තිබුණද කණ්ඩායම් ණය ක්‍රමයට ආවේණික වූ අවාසි සහගත තත්වයන්ද ගණනාවක් වේ. පසුකාලීනව කණ්ඩායම් ණය ක්‍රමය තූළම බිහිවුණු තනි තනි පුද්ගලයින් ඉලක්ක කරගත් ණය ක්‍රමය බිහිවීමට හේතු සාධක වූයේ කණ්ඩායම් ණය ක්‍රමයේ වූ මේ අවාසි සහගත තත්වයන්ය.

**කණ්ඩායම් ණය ක්‍රමයේ අවාසි**

- ✵ කොන්දේසිවල ඇති
- ✵ නම්‍යශිලීභාවය
- ✵ සමාජයෙන් සිදු කරන්නා වු පීඩනය එනම්, ග්‍රාමීය ණය ක්‍රමයෙන් ණය ලබා ගන්නවාට වඩා මුදල් පොළියට දෙන්නන් වෙතින් ණය ලබා ගන්නා තැනට පුද්ගලයාව තල්ලු කිරීමට සමාජයෙන් විශාල පීඩනයක් එල්ලවනු මේ ක්‍රම වේදය තුළදී දැකිය හැකිය.
- ✵ ණය ලබා දීමේ දී පුද්ගලයාගේ ආදායම් තත්වය, ව්‍යාපාරයේ පවතින මට්ටම, මුදල් ආයෝජනය කිරීමට ඇති හැකියාව වැනි තත්වයන් පිළිබඳව කණ්ඩායම හමුවේ හෙළි දරව් කරනු ලබන නිසා පුද්ගලයන්ගේ පෞද්ගලිකත්වය හෙළිදරව් වීමේ තත්වයක් ඇති වීම වැළැක්විය නොහැකි වීම.
- ✵ කණ්ඩායම් රැස්වීම්වලට සහභාගී වීමට සිදුවීම සහ ඒ සඳහා වැඩි වේලාවක් වැය කිරීමට සිදුවීම.
- ✵ ණය ලබා ගැනීම සඳහා කණ්ඩායමක් වෙත සම්බන්ධ වීමේ අපේක්ෂාවෙන් පැමිණෙන පිරිස් විවිධ හේතු දක්වමින් නිකරුණේ රස්තියාදු කිරීම් වලට ලක් කිරීමක් මෙම කණ්ඩායම් ක්‍රමවේදයේ දී ඇතැම් අවස්ථාවලදී සිදුවේ. මෙය කණ්ඩායම් ක්‍රමවේදය පිළිබදව ණය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් පැමිණෙන පිරිස් මානසිකව කළකිරවීමට සහ පොළි මුදලාලිලාගේ ග්‍රහනයට ඔවුන්ව නතු කිරීමට මඟ හසර පාදයි.
- ✵ කණ්ඩායම් ක්‍රමවේදයේදී අදාල කණ්ඩායමේ පිරිස් තම කණ්ඩායමේ ණය ලාභීන් වෙනුවෙන් ඇපවිය යුතුය. එහිදි ඉතා කුඩා ණය මුදලක් ලබා ගන්නා තැනැත්තෙකුට වුව තම කණ්ඩායමේ විශාල ණය මුදලක් ලබා ගන්නා පුද්ගලයෙකු වෙනුවෙන් ඇප විමට සිදුවේ.

ග්‍රාමීය බැංකු සංකල්පය අනුව ක්‍රියාත්මක වන ඇතැම් තරඟකාරී ආයතන ගනුදෙනු කරුවන් තමන් වෙත ආකර්ශනය කර ගැනීමේ අරමුණින් යුතුව මෙම ක්‍රමවේදය පවත්වාගෙන යෑමට අතිශයින් වැදගත් වන ගුණාංග හා කොන්දේසි මඟ හැර යන තත්වයක් දැකිය හැකිය. එතුළින් මේ තුළ අනිවාර්යයෙන් පැවතිය යුතු මූල්‍ය විනය, එකමුතුභාවය, වගකීම් සහගත බව වැනි ගුණාංග වලට හානි වන අතර මයික්‍රෝ ෆයිනෑන්ස් ක්‍රමවේදයේ පැවැත්මට හානිකර තත්වයක් නිර්මාණය කිරීම කෙරෙහි එය ඍජුවම බලපානු ලබයි.

සමාජය පංති හා කුල වලට බෙදී පවතින සමාජ රටාවක් තුළ මේ ක්‍රමය පවත්වාගෙන යාම තරමක් අසීරුය. හේතුව සමාජයේ උසස් යැයි සිතා සිටින පිරිස් විසින් සමාජයේ පහත් ස්ථිර වල සිටින්නවුන්ව තම කණ්ඩායමට සම්බන්ධ කර ගැනීමට දක්වන මැලිකමයි.

මෙවන් අවාසි සහගත තත්වයන් කිහිපයක් දැකිය හැකි වුවද ග්‍රාමීය බැංකු සංකල්පය තුළ දැකිය හැකි විශේෂ සාධනීය ගුණාංගද රැසකි. ඒ සම්බන්ධයෙන් අප මීළඟ "මෙහෙවර" කලාපයෙන් දැනුවත් වෙමු.



# ග්‍රාමීන් ශක්තියයි
# ඇගේ දිරියයි

ක වර දෙයක වුව ආරම්භය උවමනාව මත සිදුවෙයි. සිත ඇත්නම් පත කුඩා දැයි යන කියමනෙන් හැඟවෙන්නේ ද ඒම විය යුතුය. කල් වේලා බැලීම්, ප්‍රාග් ධනය පිළිබඳව වූ ගැටළු, ස්ථානයක් සොයා ගැනීම... යන සියළු සාධක සිත ඇති තැන ඉතා සුළු ගැටළු වේ. ජීවිතයේ බොහෝ දේට සාධාරණ ලෙස ගලපාගත හැකි මේ න්‍යාය ව්‍යාපාර සම්බන්ධයෙන්ද පොදුය. ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පළමුව සිත තළ ඇති විය යුත්තේ උවමනාවයි. කෙසේ හෝ අරඹනවා යන දැඩි අධිෂ්ඨානශීලි හැඟීම ඉනික්බිති බොහෝ මං මාවත් ඔබ වෙත විවෘත කර දෙන්නේ නොසිතන නොපතන අන්දමකට ය.

ශිරාණිගේ ජීවිතයේ අතීත මංපෙත් දිගේ සරණා විට එය සැබෑවක්මය යන්න සනාථ කරන සාධක කොතෙකුත් අපහට හමුවෙයි. නිහඬව අසා සිටින්න.... ඉහත සත්‍යය ඇගේ ජීවිතය තුළින් සැබෑවක් කරගත් අයුරු ඇය ඔබට පවසනු ඇත.

"මගේ උපන් ගම අම්බලන්ගොඩ. තාත්තා කළේ බේකරි රස්සාව, මට සහෝදර සහෝදරියො තුන් දෙනෙක් හිටියා. අපේ අම්මා රස්සාවක් කළේ නෑ. ඒ තාත්තා උපයපු මුදල අපිට ජීවත් වෙන්න ප්‍රමාණවත් වුණු නිසා. මම උසස් පෙළට වෙනකල් ඉගෙන ගත්තා. විවාහ වුණේ 1992 දී. මහත්තයා වැඩ කලේ පොලීසියේ. යුද්ධෙ හුඟාක් දරුණුවට තිබුණු කාලේ මහත්තයා වැඩකලේ වව්නියාව පොලීසියේ. මාරුවීමක්වත් නැතිව හුඟාක් කාලයක් උතුරෙ වැඩ කරපු මහත්තයා පස්සේ සේවයෙන් අස්වෙන්න තීරණය කළා. ඔය වෙද්දී අපි ඉඩම්තොට අපේම ගෙයක් හදාගෙන පදිංචි වෙලා හිටියෙ. මහත්තයා රස්සාවෙන් අයින් වෙලා ත්‍රීවිලර් එකක් එලවන්න පටන් ගත්තා. ඔය කාලෙම තමයි සුනාමියත් ආවේ. සුනාමියට අහුවෙලා අපේ තාත්තා නැති වුණා. අම්බලන්ගොඩ ගාලු පාරට කිට්ටුව තිබුණු අපේ බේකරිය තිබුණු තැනක් හොයා ගන්න බැරි මට්ටමට විනාශ වුණා.

ඒ විනාශය අපේ ජීවිත වලට තදින් බලපෑවා. මානසික වගේම ආර්ථික අතිනුත් අපේ ජීවිත කඩා වැටුණා. විශේෂයෙන් බේකරිය විනාශ වීම නිසා අපිට එතෙක් ලැබෙමින් තිබුණු ආදායම් නැති වුණා.ත්‍රීවිල් එලවලා විතරක් ගෙදර වියදම් පියවා ගන්න අමාරු වෙද්දී ඒ නැතිවුණු ආදායම් හොයාගන්න කුමක් හෝ කළයුතු වුණා. අපේ අක්කාගේ ගේ තිබුණොත් අපේ ගේ ළඟමයි. අක්කලාට ලුණු පට්ටලයක් තිබුණා.මම කළේ කොහු අරන් ගෙදරම පොඩියට ලුණු අඹරන්න පටන් ගත්තා. අඹරන ලුණු මම අක්කට විකුණලා දවසේ ආදායම හොයා ගත්තා. මුලින්ම ව්‍යාපාරය ආරම්භ කරන්න මා ළඟ සල්ලි තිබුනෙ නෑ. සමහරක් වෙලාවට කොහු ගත්තෙත් ණයට. ඒත් මට උවමනාවක් තිබුණා කොහොම හරි ව්‍යාපාරයක් ආරම්භ කරනවා කියලා. ඒ අධිෂ්ඨානය උඩ මට ප්‍රාග්ධනය වුණෙ හිතවත්කම, හිතවත්කම පාවිච්චි කරලා මම කොහු ලබා ගත්තා. මෙහෙම ටික කාලයක් වැඩකරලා ඊලඟට ලුණු අඹරන පුංචි අත් මැෂිමක් හදාගත්තා. මෙහෙම වැඩ කරගෙන යන අතරේ මට 2005 දී විතර දැනගන්න ලැබුනා ග්‍රාමීන් කියලා පුංචි ව්‍යාපාරිකයින්ට ණය දෙන සමාගමක් තියෙනවා කියලා. ණයක් ගන්න ඉදිරිපත් කරන්න වත්කමක් හරි ඇපයක් හරි නැතිව හිටිය මට ග්‍රාමීන් ණය දෙන ක්‍රමය ලොකුම අස්වැසිල්ලක් වුණා. මම ග්‍රාමීන් සාමාජිකාවක් වෙලා මගේ මුල්ම ණය මුදල විදිහට රු. 25,000.00 ක ණය මුදලක් ලබා ගත්තා. ඒ මුදලින් එකපාර වැඩි ප්‍රමාණයක් කොහු මිළදී ගත්තා. වෙලාවක් අවේලාවක් බලන්නෙ නැතිව මම දිගටම වැඩ කළා. උදේ 06.30 ට විතර වැඩ පටන් ගත්තම රෑ 7.00 - 8.00 වෙනතුරුත් වැඩකරපු දවස් ඕන තරම්. ඒ විදිහට මහන්සි වෙලා වැඩ කරලා මම තවත් එක්කෙනෙක් වැඩට ගන්න පුළුවන් මට්ටමට ව්‍යාපාරය වැඩි දියුණු කරගත්තා. තවත් අවුරුදු 03ක් විතර යනකොට ලුණු පට්ටලයක් මිලදී ගන්න පුළුවන් මට්ටමක් දක්වා ව්‍යාපාරය වැඩිදියුණු කරගන්න මට පුළුවන් වුනා. ව්‍යාපාරයට අවශ්‍ය විදිහට මම ප්‍රයිම් ග්‍රාමීන් සමාගමෙන් ණය මුදලක් ලබා ගත්තා. ඒ ණය මුදල් සතයක්වත් අපතේ යන වැඩට නොයොදා මුළුමනින්ම ව්‍යාපාරයට යෙදෙව්වා. ලුණු පට්ටලේ ක්‍රමයෙන් දියුණු වෙද්දී මම කල්පනා කළා තවත් ව්‍යාපාරයක් පටන් ගන්න ඕන කියලා. ඒ අනුව මම මිරිස් මෝලක් පටන් ගත්තා. මිරිස් මෝලට අවශ්‍ය බඩු භාණ්ඩ මිලදී ගත්තේ ප්‍රයිම් ග්‍රාමීන් ණය මුදලින්. දැන් ගමේ හුඟක් දෙනෙක් මිරිස් තුනපහ කොටා ගන්න එන්නේ අපි ළඟට. මිරිස් මෝල පවත්වාගෙන යන අතරෙම මම හිතුවා මිරිස් තුනපහ කුළුබඩු වර්ග පැකැට් කරන ව්‍යාපාරයකුත් පටන් ගත්තානම් හොඳයි නේද කියලා. එහෙම හිතුවා විතරක් නෙවෙයි මම ඒ ව්‍යාපාරයත් පටන් ගත්තා. "ශිරාණී ප්‍රඩක්ට්"නමින් දැන් අපි කරන නිශ්පාදන මහත්තයා ත්‍රී විලර් එකෙන් කඩවලටත් හෝටල් ආපනශාලාදියටත් බෙදා හරිනු ලබනවා.ඒ ව්‍යාපාරය පටන් ගන්නත් මට ණය මුදල් ලබාදීලා උදව් කළේ ප්‍රයිම් ග්‍රාමීන් සමාගම.

ග්‍රාමීන් එකේ ලක්ෂ එකහමාරේ ණය මුදල ඉල්ලලා තියෙන්නෙ . ඒ මේ ව්‍යාපාර තව දුරටත් දියුණු කරගන්න.අද වෙද්දි ලුණු පට්ටලයේ වැඩ කටයුතු වලට වෙනම සේවකයන් යොදවලා මම වැඩිපුර මහන්සි වෙන්නේ මිරිස් මෝලෙ වැඩ කටයුතු ටිකට. ඒ වැඩවලට අද මාළඟ සේවකයින් පස්දෙනෙක් ඉන්නවා.මේ කටයුතු මම පටන් ගත්තු විදිහ හිතන කොට ඇත්තටම මට හීනයක් වගේ. ඕනෑම කෙනකුට උවමනාව තියෙනවා නම් කරන්න බැරි දෙයක් නෑ කියලයි මම හිතන්නේ. අවශ්‍යතාවය තියෙන කෙනාගේ ඒ ඉලක්කය සපුරා ගන්න ස්වාභාවයෙන්ම අනිකුත් වට පිටාවත් ඉබේම සකස් වෙනවා. අපේ පීවිත වලට ඉලක්කයක් දෙන්න ඒ ඉලක්කය සාර්ථක කරගන්න අත්වැලක් වෙන්න ප්‍රයිම් ග්‍රාමීන් සමාගම නිරතුරුව අප සමඟ සිටීම ඇත්තටම ගොඩනැගෙන ව්‍යාපාරිකයින් විදිහට අපි ලැබූ ලොකුම හයියයි.

## අවශ්‍යතාවය තියෙනවා නම් කරන්න බැරි දෙයක් නෑ කියලයි මම හිතන්නේ...

### ශිරාණි මෙන්ඩිස් - අම්බලන්ගොඩ ශාඛාව





සටහන
මංජුල ප්‍රභාත් හෙට්ටිආරච්චි
ජායා - ලක්ෂමන් කුමාරතුංග














# මගේ හිතට අසරණකම පිළිබඳ හැඟීම මුලින්ම දැණුනේ එදා

## රංජන් ධර්මකීර්ති

### ශාඛා කළමනාකරු - පුත්තලම ශාඛාව

සම්පූර්න නම ៖- කරෝලිස් රංජන් ධර්මකීර්ති

උපන් දිනය (කැමති නම්) ៖- 1981.06.20

පාසැල් කාලයේ ඔබේ ප්‍රියතම පාසැල ៖- මම ඉස්කෝල හතරකට ගියා. අපේ තාත්තගේ ගම කුරුණෑගල. ඒ නිසා මම මුලින්ම ගියේ මා/කිවුල්ගස්කොටුව ප්‍රාථමික විද්‍යාලයට ඒක ගමේ පුංචි ස්කෝලයක්. ගෙදර ඉඳන් හැතැප්ම තුනක් විතර එපිටින් තිබුණු ඒ ඉස්කෝලෙට අපි ගියේ පයින්. ඉස්කෝලෙට ආපු හුඟක් ළමයි ආවේ පාට ඇඳුම් ඇඳගෙන. ඒ අඳින්න සුදු ඇඳුමක් නැති නිසා. ඒකට දෙකේ පන්තියට වෙනකම් ගියා. 2 වසරෙන් පස්සෙ පදිංචිය මාරු වුණා.ඊ ළඟට හෝ/මාළඹේ ආදර්ශ පිරිමි කණිෂ්ඨ විද්‍යාලයට ගියා.ඔය කාලෙදි අපි නැවතිලා හිටියේ පුංචිලගේ ගෙදර. රස්සාවක් හොයා ගන්න පුළුවන් වෙයි කියලා හිතලා පුංචිලගෙ ගෙදරට ආවත් තාත්තාට සමහර දවස් වලට දවසෙ වියදමවත් හොයාගන්න පුළුවන් වුණේ නෑ. ඒගමන තමයි අපේ අම්මා තීරණය කළේ රට රස්සාවකට යන්න. අපිව බලාගන්න කෙනෙක් නැති නිසා ඊළඟට අපිට පුත්තලමට යන්න වුණා... ආච්චි ළඟට. 6 ඉඳලා සාමාන්‍ය පෙළ පංතියට වෙනකම් ගිය පුත්තලමෙ ආනන්ද විද්‍යාලයට මම වඩාත් කැමතියි. හැබැයි මගේ ස්කෝල මාරු කිරිල්ල එතැනින් ඉවර වුණේ නෑ. සාමාන්‍ය පෙළ විභාගය හොඳටම පාස් වෙලා ගණිතය අංශයෙන් උසස්පෙළ හදාරන්න මාදම්පෙ සෙන්ට්‍රල් එකට මට ඊළඟට යන්න වුණා.

ක්‍රීඩාව ៖- ක්‍රිකට් ක්‍රීඩාවට කැමැතියි. ඒත් ස්කෝලෙ මම ප්‍රසිද්ධ වුණේ කෙට්දුර ක්‍රීඩකයෙක් විදිහට

පාසැල් කාලෙදි සිද්ධ වුණු අමතක නොවෙන සිදුවීම ៖- එතකොට මම හතරේ පංතියේ විතර. පුංචිලගෙ ගෙදර ඉන්නකාලේ ඒ වත්තෙ ඉඩමෙම අපිට පොල් අතු වට කරලා පොඩි ගෙයක් හදලා දුන්නා.එක දවසක් අපි ඉස්කෝලෙ ගිහින් ඉද්දි ගෙයි ඇතුලෙ පත්තුවෙවී තිබුණු ලාම්පුවක් පෙරලිලා මුළු ගෙයිම ගිනි අරන්. ගෙයි ඇතුලෙ වටිනා බඩු මුට්ටු මොකුත් නොතිබුණත් අපිට අඳින්න තිබුණු ඇඳුම් කෑලි දෙකතුනයි පොත්පත් සේරමයි ඒ ගින්නට අහුවෙලා විනාශ වෙලා තිබුණා. කබලෙන් ලිපට වැටුණා වගේ වුණු ඒ සිද්ධිය දැන ගන්න ලැබිලා අපේ ඉස්කෝලෙ ළමයින්ගෙන් ඇඳුම් පොත්පත් බෑග් මහ ගොඩක් එකතුවෙලා තිබුණා. මගේ හිතට අසරණකම පිළිබඳ හැඟීම මුලින්ම දැණුනේ එදා.

පාසැල් කාලයේදී ලොකු වුණාම වෙන්න හිතන් හිටියේ ៖- උසස්පෙළ පංතියට වෙන කම් තිබුණේ විශ්ව විද්‍යාලයට ගිහින් ඉංජිනියර් කෙනෙක් වෙන්න උණක්. ඒත් මම හිතපු තරමේ ප්‍රතිඵලයක් ලබන්න බැරි වුණු නිසා ඒ හීනෙට තිතක් තියන්න සිද්ධ වුණා.

මුල්ම ජොබ් එක හොයාගන්න වින්ද දුක ៖- අපි ඉගෙන ගත්තෙ ආර්ථික ප්‍රශ්න ගොඩක් මැද්දේ. ඒ නිසා උසස්පෙළ ලියලා ඉවර වුණු ගමන් මොකක් හරි රස්සාවක් හොයා ගැනීමේ උවමනාව මට තිබුණා. ඒ නිසා මුලින්ම තලාහේන පැත්තේ කඩේක වැඩට ගියා අඩු පඩියකට. ඒත් එතැන මහන්සි වෙනවා විතරයි මහන්සියේ තරමට ප්‍රතිඵල නෑ. මම පඩිය ගන්න ඉන්නෙත් නැතිව එතැනින් ආවා.ඊට පස්සෙ තව කාලයක් මාමා කෙනෙක් ගාව වඩුවැඩ ඉගෙන ගත්තා. එරාජ් මහතාගේ කීමට මම 2003 දී ග්‍රාමීන් සමාගමට සම්බන්ධ වෙන්නේ කාර්යාල සහායකයෙක් විදිහට. එතැන ඉඳන් පියවරෙන් පියවර මම විවිධ තනතුරු දරමින් මට කළහැකි උපරිමයෙන් වැඩ කළා. අද වෙනකොට ශාඛා කළමනාකරුවකුගේ තත්වය තෙක් මම ආවේ මා තුළ තිබුණු කැපවීම සහ අධිෂ්ඨානය මත කියලයි මම හිතන්නනේ.

ජීවිතේ වඩාත්ම සතුටට පත්වුණු දිනය සහ දුකට පත්වුණු දිනය ៖ වඩාත්ම සතුටට පත්වුණේ මගේ දුව මල්මී කාව්‍යා ඉපදුණු දවසේ. වැඩියෙන්ම දුක් වුණේ 2008 ජනවාරි 27 ඒ මගේ අම්මා නැති වුණු දවස. අපේ ජීවිත ගොඩ ගන්න අපේ අම්මා හුඟක් දුක් වින්දා.

අතීතයට යාමට වරමක් ලැබුනොත් ඔබ තෝරාගන්නා ජීවිතේ හොඳම කාලය සහ ඊට හේතුව ៖- උසස් පෙළ පංතියේ උන්නු කාලෙට. උසස් පෙළ විභාගේ සමත්වෙන්න බැරි වීම ගැන අදටත් මගේ හිතේ තියෙන්නේ දුකක්. ආපහු ඒ අවධියට යන්න පුළුවන්නම් මගේ දුර්වලතා හඳුනාගෙන ආයිත් පාරක් උත්සාහ කරන්න තිබුණා.

හරි ගස්සා ගන්න අවස්ථාවක් ලැබුනොත් ඔබ වෙනස් කරගන්නා ඔබේ දුර්වලතා ៖- මම දෙයක් කරන්න කලින් දෙතුන් පාරකට වඩා හිතනවා. ඒ නිසා සමහර දේවල් අතහැර දාන්න සිද්ධ වුණු නිසා මට අවාසි වුණු අවස්ථා තියෙනවා

ඔබේ ජීවිතයට බලපෑ පූර්වාදර්ශී පුද්ගලයකු සිටී නම් ඔහු හෝ ඇය ៖- මගේ තාත්තා.ඔහු ඉගෙන ගත්තු කෙනෙක් නොවුණත් සමාජයෙන් ලබා ගත්තු අත්දැකීම් ප්‍රායෝගිකව ජීවිතයට එකතු කර ගත්තු පුද්ගලයෙක් .තාත්තා කවදාවත් කෙනෙක්ගෙ හිත රිදෙන්න කතා කළේ නෑ. අපිට හොඳින් කරුණු කියා දුන්නා මිසක කවදාවත් තරවටු කළේ නෑ.

පළමු ආදර අත්දැකීම ජීවිතයට බලපෑ අන්දම ៖- හිතේ ඇතිවෙච්ච ආදර හැඟීම් එහෙම්මම හිතේම තද කරගෙන හිටියා මිසක කවදාවත් ඒවා එළියට දැම්මේ නෑ. ඒ නිසාම මම විවාහ වුනේ විවාහ යෝජනාවකින්. ඇය මධූෂී ජීවන්තිකා දිසානායක.

එම පුද්ගලයාගේ ඔබ දකින සුවිශේෂතාව ៖- ඇය යහපත් බිරිඳක්.ඒ නිසාම මගේ ආදරය දිනාගන්නත් ඇයට පුළුවන් වුණා.

ඔබේ ප්‍රියතම ගායකයා ៖- වික්ටර් රත්නායක

ගීතය ៖- විශේෂයක් නෑ. නිවී සැනසිල්ලේ අහන්න පුළුවන් ඕනෑම ගීතයක් අහනවා.

චිත්‍රපටිය ៖- ඓතිහාසික වෘත්තාන්ත වලට කැමැතියි.

කෘතිය ៖- කේ.ජී. කරුණාතිලකගේ කෘතින්ට කැමැතියි

අනාගත ඉලක්කය ៖- රැකියාව හොඳින් කරගෙන ඉදිරියට යාම සහ දුවට හොඳින් ඉගැන්වීම.

සටහන
මංජුල හෙට්ටිආරච්චි



**නිතරම මට පුළුවන් යැයි සිතමින් කටයුතු කරන්න.**



# ව්‍යාපාරික කටයුතු හා බැඳි උපකාරක සේවා

15 කොටස

## නූතන කළමනාකරුවන්ට අවශ්‍ය කුසලතා සහ නිපුණතා



තාක්ෂණික මානව සහ සංකල්පීය කුසලතා පමණක් නූතන කළමනාකරුවන්ට ප්‍රමාණවත් නොවේ. වර්තමාන ව්‍යාපාර ලෝකයේ සාර්ථක කළමනාකරුවකුවීමට අවශ්‍ය නිපුණතා සහ කුසලතා කිහිපයකි.

- **තීරණ ගැනීමේ කුසලතාවය -** ගැටළු සඳහා තීරණ ගැනීමට හා ඒවා විසඳීමට යෝග්‍ය ක්‍රියාමාර්ග තෝරා ගැනීම හා ක්‍රියාත්මක කිරීමේ හැකියාව
- **සන්නිවේදන කුසලතාවය -** භාෂාව හැසිරවීමේ හැකියාව හා කෙනෙකු හා සන්නිවේදනය කිරීමේ විප්ලවීය දියුණුව හා බැඳුණු හැකියාව.
- **ගෝලීය කළමනාකරණ කුසලතාවය -** ව්‍යාපාර ගනුදෙනු වලට අවශ්‍ය දැනුම හා ගෝලීයකරණය සමග ඇතිවන ගැටළු කළමනාකරණය කිරීමේ හැකියාව.
- **කාලය කළමනාකරණය කිරීමේ කුසලතාවය -** කාලය ඵලදායීව භාවිතා කිරීමේ හැකියාවයි.

අපතේ යන කාලය අවම කිරීමට කාලය සඵලදායීව කළමනාකරණය කළ යුතුය. කාලය අපතේ යාමට බලපාන ප්‍රධාන හේතු කිහිපයක් දැක්විය හැකි අතර ඒවා විසඳා ගැනීමට කාලය කළමනාකරණ කුසලතාව අවශ්‍ය වේ.

### ව්‍යාපාරයක් තුළ කළමනාකරුවකුගේ කාලය අපතේ යාමට හේතු විය හැකි සාධක

1. අනවශ්‍ය ලියකියවිලි වැඩ
2. අනවශ්‍ය දිගු දුරකතන ඇමතුම්
3. අදාල නොවන රැස්වීම්
4. දුර්වල සන්නිවේදනය
5. කලින් වේලාව වෙන් නොකර පැමිණීම්
6. අපැහැදිලි ඉලක්ක
7. දුර්වල වැඩ පැවරීම්
8. වැදගත් නොවන දෑ සඳහා ප්‍රමුඛතාවය සැපයීම
9. වැඩ සඳහා හික්මීමකින් තොර ප්‍රවේශය
10. අනවශ්‍ය පරිදි විවේක ගැනීම
11. අනවශ්‍ය ලෙස කාර්යයන් ප්‍රමාද කිරීම
12. නිපුණතාවන්ගෙන් තොර යටත් සේවකයන් හෝ ප්‍රධානීන්

### කාලය සඵලදායී ලෙස යොදා ගැනීමට කළමනාකරුවකුට අනුගමනය කළ හැකි උපක්‍රම

1. කාලය වටිනාම සාධකයක් ලෙස සැළකීම
2. කාලය සැළසුම්ගත කිරීමේ ක්‍රම යොදා ගැනීම / කාල සටහන
3. සඵලදායී ලෙස කාර්යයන් අන් අයට පැවරීම තුළින් කාලය ඉතිරි කර ගැනීම
4. දැනට කාලය භාවිතා කරන අන්දම පිළිබඳව සොයා බැලීම/අතීත කාලය හා වර්තමාන කාලය යොදා ගැනීම පිළිබඳ පර්යේෂණයට භාජනය කිරීම
5. කාලය වෙනුවෙන් ධනාත්මක ආකල්ප ඇතිකරගැනීම
6. කාල කළමනාකරන උපකරණ හා වැඩසටහන් භාවිතා කිරීම
7. කඩදාසි සමග කරනු ලබන වැඩසඳහා ඵලදායීතා සංකල්ප අනුගමනය කිරීම (5'S)

### හොඳ කළමනාකරුවකු තුළ තිබිය යුතු ගුණාංග හා ගති ලක්ෂණ

සමස්තයක් වශයෙන් ගත්කළ කළමනාකරුවෙකුගේ කාර්යය හුදෙක් පුද්ගලයන් හා සම්බන්ධය. එය පුද්ගලයන් විසින් කළ යුතු කාර්යභාරයකි. එසේම එය දුෂ්කර කාර්යභාරයකි. ඒ සඳහා කළමනාකරුවකුට අධ්‍යාපනික පුහුණුව පළපුරුද්ද අත්‍යවශ්‍යය. ඊට අමතරව කළමනාකරුවන් තුළ පැවතිය යුතු ගුණාංග කිහිපයකි.


1. සාධාරණ වීම
2. පරිත්‍යාගශීලි වීම
3. ස්ථාවර වීම
4. කාරුණික වීම
5. දයාව
6. ආත්ම විශ්වාසය
7. මානුෂිකත්වය
8. සාමාන්‍ය අවබෝධය
9. අරමුණු පිළිබඳ පැහැදිලි අවබෝධය

### කළමනාකරණයේ නව ප්‍රවණතා

- **ව්‍යාපාර ක්‍රියාවලි බාහිරට පැවරීම** ආයතනය විසින් ඉටු කරනු ලැබූ යම් යම් කටයුතු බාහිර ආයතන වලට කොන්ත්‍රාත් පදනම යටතේ පැවරීමයි (නිදː- නඩත්තු කටයුතු/ ආරක්ෂක කටයුතු/ පවිත්‍රතාව)
- **දැනුම පදනම් කරගත් ව්‍යාපාර ක්‍රියාවලි බාහිරට පැවරීම** ආයතනය විසින් ඉටු කරනු ලැබූ දැනුම පදනම් කරගත් කටයුතු බාහිර ආයතන වලට කොන්ත්‍රාත් පදනම යටතේ පැවරීමයි (නිදː- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කටයුතු)
- **ව්‍යාපාර ප්‍රමාණය පහළ දැමීම** සංවිධානයේ කටයුතු සැලසුම් සහගත ලෙස අඩු කිරීමයි. මේ යටතේ කළමනාකරුවන්ගේ හා සේවකයන්ගේ සංඛ්‍යාව කපාහැරීම ආයතනයේ නිෂ්පාදනය අඩු කිරීම නිෂ්පාදිත මිශ්‍රනය අඩු කිරීම සිදු විය හැකිය.
- සමීප සම්බන්ධතා සහිත කළමනාකරණය



**සඳකැලුම් ජයතුංග,**
**ගණකාධිකාරී,**
**ප්‍රයිම් ග්‍රාමීන්**
**මයික්‍රො ෆිනෑන්ස් ලිමිටඩ්.**




**අවශ්‍ය තැනකදී හිස පහත් කිරීමෙන් අන් අයට වඩා තම හිස කෙළින් තබාගත හැකිය.**

# බදුල්ල ශාඛාව නව නිවහනකට...

ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆිනෑන්ස් ලිමිටඩ් ශාඛා ලැයිස්තුවේ 14 වන ශාඛාව වූ බදුල්ල ශාඛාව නව නිවහනකට පිවිසීම අප්‍රේල් මස 10 වන සිකුරාදා පෙ: ව: 8.55 ට යෙදුණු සුබ මොහොතින් සිදුවිය.
මෙතෙක් අංක 67- සී, පස්සර පාර, බදුල්ල යන ලිපිනයෙහි සිය ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන ගිය බදුල්ල ශාඛාව මෙතැන් සිට අංක 24/1/1 අනගාරික ධර්මපාල මාවත,බදුල්ල යන ලිපිනයෙහි සිය ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යනු ලබයි. නව නිවහනට ගෙවදීම වෙනුවෙන් පැවැත්වූ උත්සව අවස්ථාවට කළමනාකරණ අධ්‍යක්ෂක /ප්‍රධාන විධායක නිළධාරී චමින්ද ප්‍රභාත් මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගි විය. මෙම අවස්ථාවට, ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆිනෑන්ස් ලිමිටඩ්හි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් වන ඇනස්ලි ප්‍රනන්දු, බිමල් සෙනෙවිරත්න යන මහත්වරුන්ද සහකාර සාමාන්‍යාධිකාරි පැතුම් සම්පත් මහතා ඇතුළු ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆිනෑන්ස් ලිමිටඩ්හි නිළධාරීහු සහ ගනුදෙනුකාර භවතුන් විශාල පිරිසක් සහභාගී වූහ. ප්‍රයිම් ග්‍රාමීන් ස්ථාවර තැන්පතු ,යාළු, ප්‍රයිම් සේවින්, මියුලැසි සත්කාර , ආදී ගිණුම් විශාල ප්‍රමාණයක් මෙදින අළුතින් විවෘත වූ අතර නවතම මූල්‍ය සේවා රැසක් සමඟින් සුවිශේෂී ප්‍රතිලාභ සිය ගනුදෙනුකරුවනට ලබා දීම තම අපේක්ෂාව වන බව මෙහිදී අදහස් දක්වමින් ශාඛා කලමනාකරු ලලිත් බණ්ඩාර අබයසිංහ මහතා “මෙහෙවරට” පැවසීය.












**ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆිනෑන්ස් සමාගමේ පහත නම් සඳහන් නිළධාරීහු පසුගියදා නව තනතුරු වලට පත්වූහ. නව තනතුරු ලැබූ ඔවුන් සියළු දෙනාටම අපගේ හෘදයාංගම සුභාශිංෂණ මෙසේ පළ කරන්නෙමු.**

| නම | ශාඛාව | ලැබූ තනතුර |
|---|---|---|
| නුවන් සංජීව | මැදවච්චිය | වැඩබලන ක්ෂේත්‍ර කළමනාකරු |
| සුජීත් රෝහාන් | වත්තල | වැඩබලන ක්ෂේත්‍ර කළමනාකරු |
| නුවන් දමිත් | අම්පාර | වැඩබලන සහකාර ශාඛා කළමනාකරු |
| වර්ණ දසනායක | අම්පාර | වැඩබලන ක්ෂේත්‍ර කළමනාකරු |
| ප්‍රදීප් චාමර රත්නායක | ප්‍රධාන කාර්යාලය | වැඩබලන ප්‍රදේශීය කළමනාකරු |
| වී. ක්‍රිෂ්ණමූර්ති | වව්නියා | වැඩබලන සහකාර ශාඛා කළමනාකරු |
| එස්. ජේසුදාසන් | වව්නියා | වැඩබලන ක්ෂේත්‍ර කළමනාකරු |
| එෆ්. පී. අලන්කුමාර් | මුලතිව් | වැඩබලන ක්ෂේත්‍ර කළමනාකරු |
| කේ. ශ්‍රීකාන්තන් | මල්ලාවි | වැඩබලන ක්ෂේත්‍ර කළමනාකරු |
| සමීර වසන්ත කුමාර | නාවලපිටිය | වැඩබලන ක්ෂේත්‍ර කළමනාකරු |
| ගයාන් ලියනආරච්චි | ගලෙන්බිදුණුවැව | වැඩබලන සහකාර ශාඛා කළමනාකරු |
| දිනුෂ චතුරංග | හොරණ | වැඩබලන ක්ෂේත්‍ර කළමනාකරු |
| තුසිත පෙරේරා | හොරණ | වැඩබලන ක්ෂේත්‍ර කළමනාකරු |
| රසික ප්‍රේමලාල් | හලාවත | වැඩබලන ශාඛා කළමනාකරු |
| සුගත් බණ්ඩාර යාපා | නගර ශාඛාව | වැඩබලන සහකාර ශාඛා කළමනාකරු |
| ප්‍රියංකර පෙරේරා | නගර ශාඛාව | වැඩබලන ක්ෂේත්‍ර කළමනාකරු |
| අරුණ ලක්සිරි | බෙලිඅත්ත | වැඩබලන ක්ෂේත්‍ර කළමනාකරු |
| දිමුත් චාමර | පිටිගල | වැඩබලන ක්ෂේත්‍ර කළමනාකරු |
| විරාජ් විදුරංග | දෙහිඅත්තකණ්ඩිය | වැඩබලන ක්ෂේත්‍ර කළමනාකරු |

## Happy Birthday

අප්‍රේල් සහ මැයි මාසයේ උපන්දිනය සමරන ප්‍රයිම් ග්‍රාමීන් සමාගමේ සහෝදර සේවක මහත්ම මහත්මීන් වෙත අපගේ හෘදයාංගම සුබ පැතුම් මේ සමඟ පිරිනමමු !

| නම | දිනය | ශාඛාව |
|---|---|---|
| ශාන් මල්ෂ මහතා | අප්‍රේල් 15 | මීගමුව |
| සසන්ක අබේසූරිය මහතා | අප්‍රේල් 15 | බෙලිඅත්ත |
| ලක්මාල් සඳරුවන් මහතා | අප්‍රේල් 16 | ගාල්ල |
| යෝගරාජ් ප්‍රගාෂ් මහතා | අප්‍රේල් 19 | ප්‍රධාන කාර්යාලය |
| ගයාන් රවීන්ද්‍ර මහතා | අප්‍රේල් 19 | නාවලපිටිය |
| පද්මනාදන් තනූෂන් මහතා | අප්‍රේල් 19 | කල්මුණේ |
| අසංක සේනක පෙරේරා මහතා | අප්‍රේල් 19 | දඹුල්ල |
| අසේල සඳරුවන් මහතා | අප්‍රේල් 19 | හෝමාගම |
| සුභාෂිණී කුරේ මෙනෙවිය | අප්‍රේල් 20 | මොරටුව |
| ෆාරුක් රිෆයිඩීන් මහතා | අප්‍රේල් 20 | පොතුවිල් |
| බුද්ධික පලිහක්කාර මහතා | අප්‍රේල් 21 | ප්‍රධාන කාර්යාලය |
| සජීව ප්‍රියංකර මහතා | අප්‍රේල් 21 | නිකවැරටිය |
| තිලාන් සංජීව මහතා | අප්‍රේල් 21 | අම්බලන්ගොඩ |
| චාමර තරංග මහතා | අප්‍රේල් 21 | ප්‍රධාන කාර්යාලය |
| තුෂාර හේෂාන් මහතා | අප්‍රේල් 22 | පොතුවිල් |
| ජී ඩී මහින්දසෝම මහතා | අප්‍රේල් 23 | ජා-ඇල |
| ගයාන් අනුරුද්ධ මහතා | අප්‍රේල් 23 | කඩුවෙල |
| දේවසීලන් රික් මහතා | අප්‍රේල් 23 | වත්තල |
| සුබ්‍රමනියම් දයාලන් මහතා | අප්‍රේල් 23 | නුවරඑළිය |
| වජිර ලක්මාල් මහතා | අප්‍රේල් 23 | අනුරාධපුර |
| බුද්ධික ප්‍රියන්ත කුමාර | අප්‍රේල් 23 | මාතලේ |
| කැලුම් නිලංග මහතා | අප්‍රේල් 24 | කන්තලේ |
| අජිත් පුෂ්පකුමාර මහතා | අප්‍රේල් 25 | නුවර |
| උපාලි ජයසිංහ මහතා | අප්‍රේල් 25 | කුරුණෑගල |
| අසේල කුමාර මහතා | අප්‍රේල් 25 | හෝමාගම |
| ටී . කජේන්ද්‍රන් මහතා | අප්‍රේල් 25 | යාපනය |
| ශෙහානි නිරංගා මෙනෙවිය | අප්‍රේල් 26 | බදුල්ල |
| ඉඳුනිල් කරුණාරත්න මහතා | අප්‍රේල් 26 | පදවිය |
| ඉසුරු සෙනෙවිරත්න මහතා | අප්‍රේල් 27 | පොළොන්නරුව |
| ගයාන් සුමේධ මහතා | අප්‍රේල් 27 | හලාවත |
| ගෝවින්ද වර්ණකුමාර මහතා | අප්‍රේල් 27 | දඹුල්ල |
| ෆ්‍රැන්සිස් අලන්කුමාර් මහතා | අප්‍රේල් 27 | මුලතිව් |
| ඉන්ද්‍රික පත්මකුමාර මහතා | අප්‍රේල් 28 | බණ්ඩාරවෙල |
| අසංක ප්‍රබාසිරි මහතා | අප්‍රේල් 28 | ප්‍රධාන කාර්යාලය |
| තිලංක බණ්ඩාර මහතා | අප්‍රේල් 28 | කුරුණෑගල |
| මාලක නිශාන්ත මහතා | අප්‍රේල් 28 | ඇඹිලිපිටිය |
| රෝහිත කරුණාසිංහ මහතා | අප්‍රේල් 28 | ගල්ගමුව |
| චානක සම්පත් මහතා | අප්‍රේල් 28 | කළුතර |
| සුජිත් ජයමාල් මහතා | අප්‍රේල් 28 | කන්තලේ |
| කසුන් ප්‍රියංකර මහතා | අප්‍රේල් 29 | නුවර |
| එස්. නවීන්තන් මහතා | අප්‍රේල් 29 | වවුනියා |
| වසන්ත කුමාර මහතා | අප්‍රේල් 30 | නාවලපිටිය |
| එස් රගුමානිවානන් මහතා | මැයි 01 | ත්‍රිකුණාමලය |
| සමීර සඳරුවන් මහතා | මැයි 01 | මතුගම |
| කේ. කනගලිංගම් මහතා | මැයි 01 | යාපනය |
| ගනේෂ් මහේෂ් මහතා | මැයි 01 | ප්‍රධාන කාර්යාලය |
| අජිත් කුමාර මහතා | මැයි 03 | මහියංගනය |
| තුසිත පෙරේරා මහතා | මැයි 03 | හොරණ |
| එෂාන් මධුජිත් මහතා | මැයි 03 | රත්නපුර |
| ලක්මාල් ගමගේ මහතා | මැයි 03 | නගර ශාඛාව |
| නිරෝෂන් දේශප්‍රිය මහතා | මැයි 04 | කෑගල්ල |
| සී අශෝක් කුමාර් මහතා | මැයි 04 | මන්නාරම |
| රුසිරු ප්‍රේමලාල් මහතා | මැයි 04 | කන්තලේ |
| පී.මධුෂා මෙනෙවිය | මැයි 04 | යාපනය |
| සරත් කුමාර මහතා | මැයි 05 | නිකවැරටිය |
| ශානක මධුරංග මහතා | මැයි 05 | ප්‍රධාන කාර්යාලය |
| මොහොමඩ් රිෆ්කාන් මහතා | මැයි 05 | අම්පාර |
| කසුන් මධුරංග මහතා | මැයි 05 | මොරවක |
| චමත් උෂාන් මහතා | මැයි 05 | වැලිමඩ |
| නුවන් සමීර මහතා | මැයි 06 | ප්‍රධාන කාර්යාලය |
| ලලින්ද සමිත් මහතා | මැයි 07 | ප්‍රධාන කාර්යාලය |
| ක්‍රිෂාන්ත මෛත්‍රී මහතා | මැයි 07 | දඹුල්ල |
| ප්‍රනීත මධුසංඛ මහතා | මැයි 07 | ජා-ඇල |
| පරාක්‍රම දුල්ලෑව මහතා | මැයි 07 | මාතලේ |
| රදීප් රෝහිත මහතා | මැයි 07 | කන්තලේ |
| ජී. ධනංජය මහතා | මැයි 07 | බදුල්ල |
| සදනි සමාලි මෙනෙවිය | මැයි 07 | හම්බන්තොට |
| මිල්රෝයි ස්ටැන්ලි මහතා | මැයි 07 | නාවලපිටිය |
| සුබ්‍රමනියම් විමලන් මහතා | මැයි 07 | කිලිනොච්චි |
| තමීර මැදගෙදර මහතා | මැයි 07 | කෑගල්ල |
| රොෂාන් දිල්රුක් මහතා | මැයි 08 | කෑගල්ල |
| එම්. සින්තනෙයිකුමාරන් මහතා | මැයි 08 | මඩකලපුව |
| උදාර සම්පත් මහතා | මැයි 09 | වෙන්නප්පුව |
| චන්දන රාජසිංහ මහතා | මැයි 10 | හම්බන්තොට |
| මනෝජ් චින්තක මහතා | මැයි 10 | ගම්පහ |
| චින්තක සුජිත් මහතා | මැයි 10 | බලන්ගොඩ |
| විනෝද් චතුරංග මහතා | මැයි 10 | මතුගම |
| සුපුන් අසේල කුමාර මහතා | මැයි 10 | අනුරාධපුරය |
| එන්. ගුණපාලසිංහම් මහතා | මැයි 10 | වවුනියා |
| ප්‍රසාන් ධනංජය මහතා | මැයි 11 | කළුතර |
| ආර් ඒ උදයංග මහතා | මැයි 11 | නගර ශාඛාව |
| පද්මනාදන් නිමලදාසන් මහතා | මැයි 11 | යාපනය |
| හර්ෂ මහවත්ත මහතා | මැයි 11 | කළුතර |
| සමීර චන්ද්‍රනාත් මහතා | මැයි 12 | ප්‍රධාන කාර්යාලය |
| කැලුම් නිශාන්ත මහතා | මැයි 12 | මැදවච්චිය |
| සමන්ත කුමාර මහතා | මැයි 12 | නිකවැරටිය |
| හර්ෂ මධුමාධව මහතා | මැයි 12 | හොරණ |
| නාගලිංගම් ප්‍රියදර්ශන් මහතා | මැයි 12 | කල්මුණේ |
| ආර් ඒ රොෂාන් මහතා | මැයි 13 | අනුරාධපුර |
| චන්දන ලලින්ද මහතා | මැයි 13 | කඩුවෙල |
| චන්දන බණ්ඩාර මහතා | මැයි 13 | නාවලපිටිය |
| එම්. සුජේෂ් මහතා | මැයි 14 | වව්නියාව |
| සිවලිංගම් ලෝගේෂ් මහතා | මැයි 14 | නෙල්ලිඅඩි |
| එරංද රාජපක්ෂ මහතා | මැයි 14 | දඹුල්ල |

මෙහෙවර
ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆිනෑන්ස් ලිමිටඩ්
නො :168 නාවල පාර නුගේගොඩ
ටෙලි : 0112176262 ෆැක්ස් ඃ 0112825843
ඊ-මේල් :- manjula.p@primegrameen.lk
වෙබ් :- www.primegrameen.com
අධීක්ෂණය :- චමින්ද ප්‍රභාත් (කළමනාකාර අධ්‍යක්ෂ /ප්‍රධාන විධායක නිළධාරී)
ප්‍රධාන කර්තෘ :- මංජුල ප්‍රභාත් හෙට්ටි ආරච්චි
පිටු සැලසුම් :- කේ.ඩී. චමිල චින්තක (අර්ජුන ග්‍රැෆික්ස් (පුද්) සමාගම)
පරිඝනක අක්ෂර සංයෝජනය :- උදාරි ධර්මවර්ධන / උදාර ධනංජය
ඡායාරූප ශිල්පී :- ලක්ෂ්මන් කුමාරතුංග